මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011-2484500, 011-2484600, 011-2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல / My No:
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2023.03.01

චක්‍රලේඛ අංකය : DFD/ 2023-1 (II)

ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය
ලේකම්, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
සියලුම දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන්

**2022/2023 මහ කන්නයේ රජයේ වී මිලදී ගැනීමේ සහ වී තොග බැහැර කිරීමේ වැඩසටහන**

**2023 පෙබරවාරි මස ඉහළගිය විදුලි බිල සඳහා චක්‍රලේඛ සංශෝධන ඉදිරිපත් කිරීම**

දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන් මඟින් සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල්හිමියන්/සමුපකාර සමිති හරහා වී මිලදී ගැනීම සහ වී තොග සහල් කිරීම සම්බන්ධයෙන් මා විසින් නිකුත් කරන ලද අංක DFD/ 2023-1 හා 2023.02.09 දිනැති චක්‍රලේඛය හා බැඳේ.

2023 පෙබරවාරි මාසයේ හඳුන්වාදෙන ලද විදුලි ගාස්තු සංශෝධනයත් සමඟ වී තොග සහල් කිරීමේදී දැරීමට සිදුවන නිෂ්පාදන පිරිවැය ඉහළ යාම සලකා බලා 2022/23 මහ කන්නයේ රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන යටතේ තෙත වී වියළීමේ ගාස්තු හා වී කෙටුම් කුලිය වැඩි වන බව නිරීක්ෂණය වී ඇත. ඒ අනුව, නව විදුලි ගාස්තු සංශෝධනයට අනුව තෙත වී වියළීමේ සහ වී කෙටීමේ පිරිවැය පිළිබඳ විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව උක්ත චක්‍රලේඛයේ 2.3.5හි හා 3.1.3හි සඳහන් ගාස්තු පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

1. 2.3.5හි සඳහන් කරන ලද, තෙතමනය 14% වඩා වැඩි හා තෙතමනය 22% හෝ ඊට වඩා අඩු වී කිලෝග්‍රෑම් එකක් නිසි ප්‍රමිතියට වියළීම සඳහා වැයවන වියදම වෙනුවෙන් සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල්හිමියන්/සමුපකාර සමිති සඳහා ගෙවනු ලබන රු. 4.50ක මුදල රු.4.75ක් වශයෙන් සංශෝධනය කරනු ලැබේ.

2. 3.1.3 ඡේදයේ සඳහන් කරන ලද වී තොග සහල් කිරීමේදී අදාළ කරගත යුතු ගාස්තු පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

| අංකය | සහල් වර්ගය | ලබාදෙන උපරිම පිරිවැය (වී කිලෝවක් සඳහා රු.) |
|---|---|---|
| 1 | සුදු නාඩු (තම්බන ලද) | 10.70 |
| 2 | රතු නාඩු (තම්බන ලද) | 10.70 |
| 3 | සුදු කැකුළු | 8.75 |
| 4 | රතු කැකුළු | 8.75 |

ඒ අනුව, 2022/23 මහ කන්නයේ වී මිලදී ගැනීමේ සහ වී තොග බැහැර කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී මෙම සංශෝධිත ගාස්තු අදාළ කර ගැනීමට සියලු දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන් කටයුතු කළ යුතුය.

කේ.එම්.මහින්ද සිරිවර්ධන
භාණ්ඩාගාර ලේකම්

පිටපත්:

1. ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය - කරු.දැ.ගැ.ස.
2. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස.
3. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස සහ අ.ක.ස.
4. අධ්‍යක්ෂ ජනරාල්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස. සහ අ.ක.ස.
5. අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස. සහ අ.ක.ස.
6. අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස. සහ අ.ක.ස.
7. කොමසාරිස් ජනරාල්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස. සහ අ.ක.ස.
8. අධ්‍යක්ෂ ජනරාල්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව - කරු.වැඩසටහන සඳහා අවශ්‍ය ආරක්ෂාව ලබාදීම සඳහා
9. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය - කරු.දැ.ගැ.ස.